# ගැමුණු රජු හා යක්ෂයෝ

මහාවංසයෙහි සඳහන්වන ගැමුණු රජතුමා විසින් බිඳහෙළනු ලැබූ දෙතිස් බලකොටු දෙමළ නොව යක්ෂ වීම අනෙක් කරුණු සමග සංගත වෙයි. අප කලින් සඳහන් කරන ලද පරිදි එකල තකුණු දඹදිව සොළී හෝ වෙනත් දෙමළ හෝ ආධිපත්‍යයක් නොමැති වීම එහි දී බලපාන ප්‍රධාන ම සාධකයක් වෙයි. දකුණු දඹදිව ආධිපත්‍යයක් නොමැතිව වුව ද මෙරට සොළී හෝ වෙනත් දෙමළ හෝ රාජ්‍යයක් පිහිටුවීමට නොහැකි දැයි කිසිවකුට ඇසිය හැකි ය. එවැනි රාජ්‍යයක් පිහිටුවීමට පමණක් නොව අවුරුදු හතළිස් හතරක් මුළුල්ලේ එ පවත්වාගෙන යෑමට අවශ්‍ය පිරිස් බලය ලැබුණේ කෙසේ ද යන ප්‍රශ්නයට එවිට පිළිතුරක් දිය යුතු ය.

මෙහි දී අපට වැදගත්වන කරුණක් මහාවංසයෙහි සඳහන් වෙයි. එළාර රජු පැරදීගෙන යන අවස්ථාවෙහි තමාට ආධාර පතා දඹදිවට පණිවුඩයක් යැවූ බව එහි සඳහන් වෙයි. එහෙත් එ ආධාර ලැබී ඇත්තේ මාස තුනක් ගතවීමෙන් පසුව ය. දකුණු දඹදිව සිට ආධාර එවීමට එතරම් කාලයක් ගත නො වෙයි. මහාවංසයෙහි සඳහන් ආකාරයට ගැමුණු රජු එළාර රජුට එරෙහිව ඇරඹි යුද්ධය තරමක කාලයක් පැවතී ඇත. එ කාලය තුළ එළාර රජුට අවශ්‍ය පිරිස් බලය (ආධාර) මෙරටින් ම ලැබුණු බවට සැකයක් නැත. එළාර රජු විදේශයකින් පිරිස් බලය සොයන්නට ඇත්තේ මෙරටින් ලැබුණු පිරිස් බලය නැති වී යෑමෙන් පසුව යැයි සිතිය හැකි ය.

එළාර රජුට මෙරට යක්ෂ ගෝත්‍රික පිරිසකගෙන් සහාය ලැබී ඇති බව වංසකතාවලින් වුව ද පැහැදිළි වෙයි. ටොලමිගේ සිතියමෙහි මහවැලි ගඟ සඳහන් වනුයේ පරසියන් ගඟ ලෙස බව කලින් සඳහන් කෙළෙමු. මහවැලි ගඟ අසබඩ පොළොන්නරුව දක්වා ම බොහෝ විට ඉනුදු ඔබ්බට ජදිංචි ව සිට ඇත්තේ පරසියාවෙන් හෝ එ අසළින් හෝ පැමිණි යක්ෂ ගෝත්‍රිකයන් වීම නිසා ටොලමි එ ගඟ එලෙස හඳුන්වන්නට ඇත. මහවැලි ගඟින් එපිට විසූ යක්ෂයන් ද එළාර රජුට පක්ෂ වී ඇති බව වංසකතාවෙන් හෙළිදරවු වෙයි.

රිටිහල ජයසේන, මිත්‍ර සෙනෙවි ආදීහු එවැන්නෝ වූහ. එහෙත් එ අතර ඇතැම් යක්ෂ ගෝත්‍රිකයෝ කාවන්තිස්ස රජුට හා ගැමුණු රජුට පක්ෂපාති වූහ. මිත්‍ර සෙනෙවිගේ බෑණනුවන් වූ නන්දිමිත්‍ර එවැන්නෙකි. සුරනිමල ද එසේ ගැමුණු රජුට පක්ෂපාති වූ තවත් යක්ෂ ගෝත්‍රියකු බව පැහැදිළි ය. වංසකතා පුවත අනුව ඔහුගේ සොහොයුරන් ඔහු පන්නා දමා ඇත. මේ සොහොයුරන් එළාර රජුට පක්ෂ වන්නට ඇත.

යුද්ධය දික්ගැස්සෙනවාත් සමග මේ යක්ෂ ගෝත්‍රිකයන් මිය යෑමත්, ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් එළාර රජු අතහැර ගැමුණු රජුගේ පැත්ත ගැනීමත් හේතුවෙන් එළාර රජුගේ පිරිස් බලය අඩුවන්නට ඇති බව පැහැදිළි ය. ඔහු පිරිස් එවන ලෙස ඉල්ලමින් තමන් පැමිණි රටට පණිවුඩ යවන්නට ඇත්තේ ඉන් පසුව ය. ආධාර එවීමට මාස තුනකට වැඩි කාලයක් ගත වී ඇත. එ අතර එළාර රජු යුද්ධයෙන් පරාජය වී ඇත.

ගැමුණු කුමරු හා කාවන්තිස්ස රජු එළාර රජුට විරුද්ධව කෙරුණු යුද්ධයට සූදානම් වීමේ දී හැකිතාක් යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආධාර ලබාගැනීමට කරයුතු කර ඇත. නන්දිමිත්‍ර, සුරනිමල වැනි සේනාපතියන් මෙන් ම ගෝඨයිම්බර වැන්නන් ද යක්ෂ බව පැහැදිළි ය. මේ යක්ෂ ගෝත්‍රික සෙනෙවියන් වෙනත් යක්ෂ ගෝත්‍රික සෙනෙවියන්ගේ ආධාරය ගැමුණු කුමරුට ලබාදීමට ද කටයුතු කර ඇත.

එ අතර බෞද්ධයකු වූ ගැමුණු රජු යක්ෂ ගෝත්‍රික දෙවිවරුන්ගේ ද පිහිට යදිමින් පුද පූජා පවත්වා ඇත. එසේ කරන්නට ඇත්තේ එක් පැත්තකින් යක්ෂ ගෝත්‍රිකයන්ගේ සිත දිනාගැනීමට බව පැහැදිළි ය. අනෙක් පැත්තෙන් ගැමුණු රජු එ දෙවියන්ට පුදපූජා පවත්වන්නට ඇත. සිංහල බුද්ධාගමෙහි, එනම් සිංහලයන්ගේ බුද්ධාගමෙහි අන්‍යාගමික දෙවිවරු ද සිටිති. එසේ වීමට හේතුව සිංහලයන් බෞද්ධයන් වීමට පෙර යක්ෂ හා අනෙක් ගෝත්‍ර අනුගමනය කරමින් ඔවුන්ගේ දෙවියන් ද ඇදහීම ය.

© Prof. Nalin De Silva

ඉංගිරිසින් ද සිංහලයන්ගේ ආගම හඳුන්වා දී ඇත්තේ බුද්ධාගම හා දේවාගම යනුවෙනි. උඩරට ගිවිසුම යනුවෙන් හැඳින්වෙන ගිවිසුමෙහි බුද්ධාහම හා දේවාගම රැකීමට ඉංගිරිසිහු පොරොන්දු වූහ. ඔවුන් ඒ පොරොන්දුව වැඩිකල් ගතවීමට පෙර කැඩූ නමුත් ඉන් සිංහල බුද්ධාගම ගැන යමක් කියැවෙයි. ගැමුණු රජුට පෙර සිට ම සිංහල බුද්ධාගමෙහි දෙවියන් ද වූ බව ඇතැම් ඕල්කට් බෞද්ධයන්ට නො වැටහෙයි. ගැමුණු රජු එළාර රජු සමග යුද්ධයට පෙර කතරගම දේවාලයට ගොස් මහසෙන් දෙවියන්ට පුද පූජා පවත්වා ඇත. එසේ කරන්නට ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන් සතුටු කිරීමට පමණක් නොව මහසෙන් දෙවියන් ද සිංහල බුද්ධාහමට ඇතුළත් වී සිටි බැවින් විය යුතු ය.

කොත්මලේ ප්‍රදේශයෙහි පවත්නා ජනප්‍රවාදයකට අනුව ගැමුණු කුමරු එහි ගියේ එහි ජීවත් වූ යක්ෂ ගෝත්‍රිකයන් තමන් වෙතට නම්මවා ගැනීමට බව වෛද්‍ය චන්න ජයසුමන මහතා පවසයි. එහි යම් සත්‍යතාවක් ඇතැයි සිතිය හැකි ය. කෙසේ වෙතත් මේ කරුණු සියල්ලෙන් පැහැදිළි වන්නේ පඬුඅබා රජු දවස යක්ෂ ගෝත්‍රිකයන් රාජ්‍ය බලය ලබාගත් බව නොව යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පිරිසකගේ ද සහාය ඇතිව එතුමා සිංහල ජාතිය ගොඩනැඟීම ආරම්භ කළ බව ය. ගැමුණු කුමරුගේ බිසව ද කොත්මලේ ප්‍රදේශයේ යක්ෂ ගෝත්‍රික කාන්තාවක බව කියැවෙයි. මහාවංසය බොහෝ විට මෙරට රජවරුන්ගේ යක්ෂ ගෝත්‍රික බිසවුන් ගැන නිහඬවීම තේරුම්ගත හැකි ය.

ඉන් පසුව ද සිංහල ජාතියෙන් පිටත සිටි අර්ධ වෛදිකයන් පිරිසකගේ හා යක්ෂ ගෝත්‍රිකයන් පිරිසකගේ එකතුවෙන් ගැමුණු රජතුමා සිංහල ජාතිය හා රාජ්‍යය තවත් තහවුරුකර ඇත. එතුමා සිංහල බෞද්ධ රාජ්‍යය මෙරට පිහිටුවා අපට අලිඛිත ව්‍යවස්ථාවක් ද ලබා දී ඇත. 1815 දී ගිවිසුමකින් ඉංගිරිසින්ට රට භාර දෙන තුරුම අප පාලනය කෙරුණේ ඒ ව්‍යවස්ථාවට අනුව ය. ඉංගිරිසින්ට වුව ද ඒ ව්‍යවස්ථාව මුළුමනින් ම අමතක කිරීමට නොහැකි වූ බව සිංහල ඉංගිරිසි ගිවිසුමෙහි බුද්ධාහම හා දේවාගම රැකීමට හා සිංහල නීතිය අනුව රට කරවීමට ඉංගිරිසින් පොරොන්දු වීමෙන් පැහැදිළි වෙයි.

ගැමුණු කුමරු රජ වී සිංහල බෞද්ධ රාජ්‍යය පිහිටුවීමෙන් පසුවත් ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතියෙන් බාහිර ව ජීවත් ව සිටි බව පෙනී යයි. මෙහි දී මතකයට නැගෙන වැදගත් චරිත දෙකක් වෙයි. ඒ සීගිරි කාශ්‍යප රජු හා මහසෙන් රජු ය. මේ දෙදෙනාම අදාළ රජවරුන්ගේ යක්ෂ ගෝත්‍රික බිසවුන්ගේ පුතුන් යැයි කියැවෙයි. එකල සිංහල රජවරු යක්ෂ ගෝත්‍රිකයන්ගේ සහාය තවදුරටත් ලබාගැනීම සඳහා යක්ෂ ගෝත්‍රික බිසවුන් ද සරණපාවා ගන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. මේ විවාහ හේතුකොටගෙන යක්ෂ ගෝත්‍රිකයන්ගේ සහාය බොහෝ විට සිංහල රාජ්‍යයට ලැබෙන්නට ඇති නමුත් ඇතැම් අවස්ථාවල ඒ පරහට සිටි බව ද පෙනී යයි.

එසේ වී ඇත්තේ යක්ෂ ගෝත්‍රික බිසවගේ පුත් කුමරුවකු ශක්තිමත් වූ අවස්ථාවල දී ය. එවැනි අවස්ථාවල දී ඒ පුත් කුමාරවරු රජකමට ටික කලකට හෝ පත්වීමට සමත්වූහ. කාශ්‍යප රජු මෙහි දී මහසෙන් රජුට ද වඩා විශේෂත්වයක් දරයි. මහසෙන් රජුට දෙටුතිස් රජුගෙන් පසුව රජකම ලැබුණු නමුත් කාශ්‍යප රජුට එලෙස උරුමයෙන් රජකම ලැබුණු බවක් සඳහන් නො වෙයි. ඔහු රජ වී ඇත්තේ උරුමයට වඩා ශක්තිය හා බලය යොදාගනිමින් ය. ඇතැම්විට උරුමයෙන් (වැඩිමහල් කුමරු ලෙස) ඔහුට හිමිව තිබූ රජකම ගැනීමට මුහලන් කුමරු කුමන්ත්‍රණයක් කළා විය හැකි ය. එහිදී කාශ්‍යප රජුගේ යක්ෂ සංස්කෘතියට තිබූ ඇල්ම ඔහුට විරුද්ධව සිටියා විය හැකි ය. කාශ්‍යප රජු මෙන් ම මහසෙන් රජු ද යක්ෂ ගෝත්‍රිකයන්ට සහ යක්ෂ සංස්කෘතියට වැඩි ඇල්මක් දැක් වූ බව පෙනී යයි.

මේ දෙදෙනා ම මහාවංසයට අනුව බුද්දහමට පක්ෂපාති නොවූ බව පෙනී යයි. ඇතැම්විට ඔවුන් දෙදෙනා ම අඩුම තරමින් මුල්කාලවල දී ථෙරවාද බුද්දගමට විරුද්ධ වන්නට ඇත. පසු කලෙක සීතාවක රාජසිංහ රජු ද තම බෞද්ධකම අත්හැර ඇත. සිංහල ඉතිහාසයෙහි බෞද්ධකම අත්හැරි හෝ බෞද්ධ නොවූ හෝ බොරුවට බෞද්ධ වූ හෝ රජවරුන් ගැන ලියැවී ඇත්තේ එතරම් සුහදත්වයකින් නො වෙයි. මෙය බලාපොරොත්තු විය හැකි තත්වයකි. ගැමුණු රජුගේ සිංහල බෞද්ධ රාජ්‍යයෙහි නොලියැවුණු ව්‍යවස්ථාව අනුව මෙරට රජවිය යුත්තේ බෞද්ධයෙකි. ඔහු ථෙරවාද බෞද්ධයකු වීම ද අනිවාර්ය විය.

අද පවා තත්වය එසේ ම ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නොවන්නකුට මෙරට ජනාධිපති හෝ එකල නම් අගමැති හෝ වීමට නො හැකි ය. නුවර යුගයෙහි නායක්කාර වාංශිකයන්ට රජවීමට හැකිවූයේ බෞද්ධවීමෙන් පසුව ය. ඔවුන්

© Prof. Nalin De Silva

ඇතැමකු බෞද්ධ වූයේ බොරුවට බව ද පැහැදිලි ය. එමෙන් ම වර්තමාන යුගයෙහි ඉංගිරිසීන් සිංහල බෞද්ධයන් නොවන්නන් මෙරට නායකත්වයට පත්කිරීමට උත්සාහ දැරූ නමුත් ඒ සියළු උත්සාහ අවසානයේ දී පරාජය විය. ජේ. ආර්. ජයවර්ධන මහතා මෙන් ම ඇස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතා ද බුද්දහම වැළඳගත්හ. ඔවුන් ව්‍යාජ බෞද්ධයන් වී යැයි මෙයින් නො කියැවෙයි. මේ තත්වය ලංකාවට පමණක් සීමාවූවක් නොවන බව ද පැහැදිලි කර ගත යුතු ය.

ඕනෑම රටක් තම රාජ්‍ය නායකයා තම රටේ ප්‍රධාන හෝ විශේෂිත හෝ සංස්කෘතිය නිරූපණය කරන්නකු විය යුතු බවට සම්මුතියක් ඇතිකරගෙන ඇති බව පෙනී යයි. අද බ්‍රිතානියේ රාජ්‍ය නායකයා ඔවුන්ගේ රැජින ය. ඇය එංගලන්තයේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය නිරූපණය කරනු පමණක් නොව ඇංග්ලිකන් ක්‍රිස්තියානි ආගමෙහි නායිකාව ද වන්නී ය. බ්‍රිතානියේ අගමැති බ්‍රවුන් මහතා ද ඒ සංකෘතියෙහි ම වෙයි. එහෙත් ඔහු ජන්මයෙන් ඉංගිරිසිකාරයකු නොවී ස්කොට් ජාතිකයක (වාර්ගිකයක) වීම ඔහු මුහුණ පා ඇති ඇතැම් ප්‍රශ්නවලට හේතුව වෙයි.

ඔබාමා මහතා ඇමරිකානු එක්සත් ජනපදයෙහි ජනාධිපතිවීමට බොහෝ ඉඩකඩක් ඇත. ඔහුගේ පියා කෙන්යානු මුස්ලිම් අයකු වුවත් ඔහුට කෙන්යාවේ ජනාධිපතිවීමට සිහිනෙන්වත් නො හැකි ය. ඔහුට ඇමරිකන් එක්සත් ජනපදයේ ජනාධිපතිවීමට ඉඩක් ඇත්තේ ඔහු සංස්කෘතියෙන් ඇමරිකන් ක්‍රිස්තියානි වීම නිසා ය. ඔහු මුස්ලිම් වී නම් ඔහුට ඩිමොක්‍රටික් පක්ෂයේ අපේක්ෂකත්වය වුව ද නො ලැබෙනු ඇත. ඇමරිකානුවන් වෙනත් සංස්කෘතියක අයකු තම ජනාධිපතිධුරයට පත්කර නොහනු ඇත. මෙරට ඊනියා ප්‍රබුද්ධයන්ට ඇති කුලප්පුව ඇමරිකානුවන්ට හෝ ඔවුන්ගේ බුද්ධිතුන්ට හෝ නැත. ඔබාමා මහතා සංස්කෘතියෙන් මෙන් ම ආගමින් ද ක්‍රිස්තියානි වී තිබිය දී ද මැතිවරණ ව්‍යාපාරයේ දී ඔහුගේ මුල් මුස්ලිම්කම ඇදගැනීමට ඇතැම් රිපබ්ලිකන් පාක්ෂිකයෝ උත්සාහ කළහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva